# ශ්‍රී ලංකාවේ පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟයට බුද්ධි ගලනය හේතුවක්ද?




මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව

ආර්.එම්.ජේ.එච්.ගජනායක

සංවර්ධන නිලධාරී

# ශ්‍රී ලංකාවේ පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟයට බුද්ධිගලනය හේතුවක්ද?

හැඳින්වීම

සංවර්ධනය වෙමින් පවතින රටවල බහුලව දැකිය සංසිද්ධියක් ලෙස බුද්ධිගලනය හඳුනාගත හැකිය. එය ජාත්‍යන්තර මානව සංක්‍රමණයේ වැදගත් ප්‍රවණතාවකි. බුද්ධිගලනය යන්නෙන් අදහස් කරන්නේ ‘ වඩා හොඳ අවස්ථාවන් සොයමින් ඉහළ නිපුණතා ඇති වෘත්තිකයන් විදේශ රටවලට සංක්‍රමණය වීම’යන්නයි
නූතන ලෝකයේ බුද්ධිමතුන් විශාල සංඛ්‍යාවක් තම මව්බිම අතහැර සංවර්ධිත රටවල පදිංචි වෙති. විදේශයන්හි අධ්‍යාපනය ලබන සහ අධ්‍යාපනය සම්පූර්ණ කරන පුද්ගලයින් නැවත සිය මව් රටට නොපැමිණෙන විට හෝ තම මව් රටේ අධ්‍යාපනය ලබන පුද්ගලයින් වැඩි වැටුප් හෝ වඩා හොඳ අවස්ථාවන් සඳහා සංක්‍රමණය වන විට බුද්ධිගලනය ඇතිවිය හැකිය.(මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව- 2018)

බුද්ධිගලනය සඳහා හේතුවන කරුණු රාශියකි,

- උගත්කමට සරිලන රැකියාවක් දේශියව නොමැතිවීම.
- වඩාත් ඵලදායී සහ ප්‍රතිලාභ සහිත රැකියා අවස්ථා විදේශයන්හි පැවතීම.
- පවතින සමාජයීය තත්ත්වය පිළිබඳ කළකිරීම නිසා
- අනෙක් අයට වඩා හොඳින් ජීවත් වීමේ අපේක්ෂාව.
- විදේශ රැකියාවක් කරන නිසා වැඩි පිළිගැනීමක් ඇතිවේ යැයි සිතීම.
- වැඩිදුර අධ්‍යාපනය ලබා ගැනීම සඳහා විදේශගතවීම සහ එම රටවල්වල පදිංචි වීම
- කෙටිකාලීන රැකියාවට ගොස් වෙනත් රැකියා අවස්ථා ලැබීම නිසා නතර වීම
- ජනවාර්ගික හෝ සාමාජීයිය වශයෙන් වෙනස් ලෙස සැලකීමට ලක්වීම
- විදේශගත වූ සාර්ථක චරිත දැකීමට ඇතිවන පෙළඹවීම

බුද්ධිගලනය යන්න “මානව ප්‍රාග්ධන පලා යාම” (Human Capital Flight) ලෙස විද්වතුන් හඳුන්වන සංකල්පයේ ප්‍රතිඵලයක් බව බොහෝ දෙනා පිළිගනී. මේ න්‍යායට අනුව සාමාන්‍ය මිනිසුන් හඳුන්වා තිබෙන්නේ හැකි සෑම විටම තමන්ට ලබා ගත හැකි ඕනෑම දෙයක් ලබා ගැනීමට කැමති පිරිසක් ලෙසය. ඒ නිසා තමන්ගේ හැකියාවන්ට ඉහළ වරප්‍රසාද ලබා දෙන තැනකට යාමට ලොකු පෙළඹවීමක් ඇති වේ. වෙනත් බාධක නැතිනම් නිතැතින්ම ඒ අදහස ඔවුන් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරයි.

1948 දී ශ්‍රී ලංකාව නිදහස ලබන විට අත්‍යවශ්‍ය මානව සේවා සඳහා අපේම වෘත්තිකයන් ප්‍රමාණවත් විය. එහෙත් 1950 දශකයේ දී ශ්‍රී ලාංකික බුද්ධිමතුන් විදේශයන්හි රැකියා සොයා ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාමට පටන් ගත්හ.
1960 සහ 1970 දශකවල වෘත්තිකයින්ගේ විදේශගතවීම් ක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. විශේෂයෙන් 1976 ට පෙර මුල් අවදියේ දී වෘත්තිකයන්ගේ ප්‍රවණතාව වූයේ රැකියාව සඳහා තම පවුල් සමඟ සංක්‍රමණය වී අවසානයේ ස්ථිරවම විදේශයන්හි පදිංචි වීමයි. මෙම ප්‍රවණතාවය රජය විසින් 1975 දී සංචාරක සීමාවන් මගින් පාලනය කරන ලදී.
1977ට පෙර බුද්ධිමතුන්ගේ සංක්‍රමණය පිළිබඳව ශ්‍රී ලංකා සමාජයේ විශාල කතාබහක් ඇති වුවද, විවෘත ආර්ථිකය විසින් මෙම තත්ත්වය වෙනස් කරන ලදී. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙකුට විදේශ රැකියා සඳහා අවස්ථා ලැබේ.


එබැවින් ඉහළ සාක්ෂරතාවයක් ඇති විශාල පිරිසක් විදේශ රටවලට, විශේෂයෙන් යුරෝපයට හා නව ලෝකයට (ඇමරිකා එක්සත් ජනපදය හා කැනඩාව) මෙන්ම ඈත පෙරදිගට (ජපානය) සංක්‍රමණය වූ අතර, එබැවින් ශ්‍රම සංක්‍රමණය සමස්ත සමාජයේම වැදගත් ලක්ෂණය වූ අතර මෙම නව ප්‍රවණතාව

කෙරෙහි අවධානය යොමු විය. එබැවින් බුද්ධිගලනය පිළිබඳ ගැටළුව අළුතින් මතුවූ ශ්‍රම සංක්‍රමණය පිළිබඳ සංකල්පය ඉක්මවා ගියේය.

විදේශ සංක්‍රමණ - 2009 – 2018

| | වෘත්තීය මට්ටම | | මධ්‍යම මට්ටම | | ලිපිකරු හා ඒ ආශ්‍රිත | | පුහුණු ශ්‍රමික | | අර්ධ පුහුණු ශ්‍රමික | | නුපුහුණු ශ්‍රමික | | ගෘහ සේවිකා | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | මුළු එකතුව |
| 2009 | 2,832 | 1.15 | 6,388 | 2.58 | 6,719 | 2.72 | 61,321 | 24.8 | 6,015 | 2.43 | 50,173 | 20.3 | 113,678 | 46.0 | 247,126 |
| 2010 | 3,057 | 1.14 | 6,884 | 2.57 | 7,923 | 2.96 | 71,537 | 26.7 | 4,932 | 1.84 | 60,422 | 22.6 | 112,752 | 42.2 | 267,507 |
| 2011 | 3,844 | 1.46 | 6,134 | 2.33 | 9,906 | 3.77 | 67,726 | 25.8 | 4,180 | 1.59 | 63,680 | 24.2 | 107,491 | 40.9 | 262,961 |
| 2012 | 4,448 | 1.57 | 9,280 | 3.29 | 16,184 | 5.73 | 67,150 | 23.8 | 3,467 | 1.23 | 62,907 | 22.3 | 119,011 | 42.1 | 282,447 |
| 2013 | 5,151 | 1.76 | 16,510 | 5.63 | 26,561 | 9.06 | 73,707 | 25.1 | 3,412 | 1.16 | 70,977 | 24.2 | 96,900 | 33.1 | 293,218 |
| 2014 | 5,372 | 1.79 | 20,778 | 6.91 | 29,267 | 9.73 | 73,162 | 24.3 | 3,977 | 1.32 | 79,519 | 26.4 | 88,628 | 29.5 | 300,703 |
| 2015 | 6,251 | 2.37 | 6,951 | 2.64 | 12,501 | 4.75 | 81,682 | 31 | 4,847 | 1.84 | 77,985 | 29.6 | 73,226 | 27.8 | 263,443 |
| 2016 | 6,578 | 2.71 | 8,234 | 3.39 | 10,862 | 4.47 | 76,545 | 31.5 | 3,926 | 1.62 | 71,656 | 29.5 | 65,015 | 26.8 | 242,816 |
| 2017 | 6,371 | 3.00 | 7,124 | 3.36 | 9,265 | 4.37 | 68,993 | 32.5 | 3,295 | 1.55 | 61,057 | 28.8 | 56,057 | 26.42 | 212,162 |
| 2018 | 7,210 | 3.4 | 7,748 | 3.7 | 10,021 | 4.7 | 67,054 | 31.7 | 2,770 | 1.3 | 51,719 | 24.5 | 64,938 | 30.7 | 211,460 |

**මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව**




ඉහත දත්ත දෙස බැලීමේ දි දක්නට ලැබෙන්නේ වැඩි ප්‍රමාණයක් විදේශගත වී ඇත්තේ **පුහුණු ශ්‍රමිකයින්** බවයි.


මහ බැංකුව විසින් 2018 වර්ෂය සඳහා වන සිය වාර්ෂික වාර්තාවෙන් විදේශ රැකියා ප්‍රේෂණයන් නුපුහුණු හා අර්ධ නිපුණතා කාණ්ඩවල සිට පුහුණු කාණ්ඩ දක්වා වෙනස් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර තිබේ. (මහ බැංකු වාර්තාව)
දීර්ඝ කාලීනව බලන විට එක දිගටම සිදු වෙන බුද්ධිගලනය නිසා පැහැදිලිවම ශ්‍රී ලංකාවට අහිසි බලපෑමක් ඇති විය හැකිය. ඉංජිනේරුවන්, විද්‍යාඥයින් සහ විශේෂඥයින් වැනි අනෙකුත් බුද්ධිමතුන්ගේ සංක්‍රමණය ද රටේ සංවර්ධනයට බලපායි. රටේ සංවර්ධන ක්‍රියාවලියේදී විද්‍යාව හා

විද්‍යාත්මක පර්යේෂණ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. පුහුණුව ලත් විද්‍යාඥයෙකුගේ නික්මයාම බොහෝ පර්යේෂණ ආයතනවලට බලපා ඇත. විද්‍යාව හා තාක්‍ෂණය සංවර්ධනයේ ආයුධ දෙක වන බැවින් බුද්ධිගලනය හේතුවෙන් ඒවායේ ගුණාත්මකභාවය අඩුවීම ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ වේගයට අහිතකර ලෙස බලපානු ඇත. රටේ විවිධ ක්ෂේත්‍රවල අත්දැකීම් බහුල වෘත්තිකයන් ගණනාවක් රට හැර යෑම නිසා ඔවුන්ගේ සේවය අවශ්‍ය වන සෑම අංශයකම ඉදිරි ගමනට බාධා ඇති විය හැකිය. රටේ ආර්ථිකයට ඉතා විශාල දායකත්වයක් සලසන ව්‍යාපාර, අධ්‍යාපනය, සෞඛ්‍ය, ඉදිකිරීම්, බලශක්තිය සහ ප්‍රවාහනය වැනි අංශ ගණනාවක දැනටමත් පුහුණු සහ අත්දැකීම් බහුල වෘත්තිකයන්ගේ හිඟයක් පවතී. විශේෂයෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රය ගත්විට වර්තමානය වන විට ශ්‍රම හිඟයක් දක්නට ලැබේ. පුහුණුවක් සහිත ශ්‍රමිකයන් ලංකාවේ නොමැති නිසා වෙනත් රටවලින් ශ්‍රමික පිරිස් ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියාවලට යොදවා ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්විට ද එය දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන්ගේ සංක්‍රමණ හේතුවෙන් ඔවුන්ගේ හිඟයක් දක්නට ලැබේ. වාර්ෂිකව ශ්‍රී ලංකාව වෛද්‍යවරුන් සැලකිය යුතු ප්‍රමාණයක් බිහි කළ නමුත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් විදේශයන්හි රැකියා සොයති. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය රෝහල්වල ප්‍රමාණවත් වෛද්‍යවරුන් නොමැත . ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව දක්වන ආකාරයට එක් වෛද්‍යවරයෙක් සඳහා රෝගීන් සංඛ්‍යාව 1,035ක් වේ.( ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව)

ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණය

| රට | 2014 | | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **සෞදි අරාබිය** | 80,480 | 26.8 | 74,910 | 28.4 | 63,293 | 26.1 | 37,900 | 17.9 | 35,866 | 17.0 |
| **කටාර්** | 84,622 | 28.1 | 65,111 | 24.7 | 59,523 | 24.5 | 56,644 | 26.7 | 50,774 | 24.0 |
| **කුවේට්** | 43,552 | 14.5 | 38,451 | 14.6 | 32,400 | 13.3 | 37,420 | 17.6 | 46,951 | 22.2 |
| **එක්සත් අරාබි එමීර් රාජ්‍ය** | 50,347 | 16.7 | 43,601 | 16.6 | 40,117 | 16.5 | 36,657 | 17.3 | 32,836 | 15.5 |
| **වෙනත්** | 41,702 | 13.9 | 41,234 | 15.7 | 47,483 | 19.6 | 43,541 | 20.5 | 45,032 | 21.3 |
| **එකතුව** | 300,703 | 100 | 263,307 | 100 | 242,816 | 100 | 212,162 | 100 | 211,459 | 100.0 |

**මූලාශ්‍රය- ශ්‍රී ලංකා මහබැංකු වාර්තා**




රැකියා සඳහා සමස්ථ පිටව යෑම් ගත් විට වැඩි ප්‍රමාණයක් මැදපෙරදිග කලාපය ඉදිරියෙන් ම සිටී.

බුද්ධිගලනය පිළිබඳව සලකා බලන විට, ශ්‍රී ලංකා රජය විසින් බුද්ධිගලනය අවම කිරීම සඳහා ගන්නා උත්සාහයන් කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම වැදගත්ය. පළමු උත්සාහය වූයේ බුද්ධිගලනය

වළක්වා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමයි. එය ජාතික මට්ටමින් ක්‍රියාත්මක කළ වැදගත් තීරණයක් විය. මෙම කැබිනට් යෝජනාවලදී පහත සඳහන් කරුණු සලකා බලන ලදි.

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සඳහා විදේශීය විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට තීරණය විය.
- විදෙස් සංචාර සඳහා නිවාඩු පැනවීම, නිවාඩු ලබා දීම සහ රජයේ සේවකයන්ට වසර පහක නිවාඩු ලබා දීම.
- විදේශ සංචාරවලදී පරිභෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය වැඩි කරන ලදී. වෘත්තීය විශේෂඥයින්ට උපදේශක සේවා සඳහා අවස්ථා ලබා දීම. (http://archives.dailynews.lk/2010/12/22/fea 01.asp)

සංවර්ධනය වෙමින් පවතින රටක බුද්ධිගලනය සිදුවන විට එරටෙහි ආර්ථිකයට සෘණාත්මක බලපෑමක් ඇතිවිය හැකිය.

- බදු ආදායම් අහිමි වීම
- අනාගත ව්‍යවසායකයින් අහිමි වීම
- පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟයක් ඇතිවීම
- නවෝත්පාදන අදහස් අහිමිවීම
- අධ්‍යාපනය සඳහා රටේ ආයෝජන අඩුවීම

බුද්ධිගලනයේ ප්‍රතිවිරුද්ධ තත්ත්වය ලෙස බුද්ධි ග්‍රහනය (brain gain) ලෙස හැඳින්විය හැකිය. එනම් පුහුණු සහ දක්ෂ පුද්ගලයින් රටකට ඇතුළු වීමට උත්සාහ කිරීමයි. විදේශිය සම්බවයක් සහිත වෘත්තිකයින්ගේ සංඛ්‍යාව ඉහළ යාම එම රටේ සංවර්ධනයට වැදගත් සාධකයක් වේ.

එක් රටක සිට තවත් රටකට බොහෝ දක්ෂ හා උගත් පුද්ගලයින් අහිමි වීම එක රටක සංවර්ධනයට වාසි වන අතර, අනෙක් රටෙහි සංවර්ධන ක්‍රියාවලියට බාධාවක් වනු ඇත.

**විශේෂ උපුටා ගැනීම්**

- ❖ 2017 වර්ෂයේ පෞද්ගලික ප්‍රේෂණ රු. මිලියන 1,091,972කි.
- ❖ වර්ෂය තුළ දිනකට විදේශ රැකියා සඳහා සාමාන්‍ය පිටත්වීම් 581ක් විය.
- ❖ සමස්ථ විදේශ රැකියාවලින් බහුතරය විදේශ රැකියා සඳහා පිරිමි සහභාගීත්වය වැඩි විය. 2017 වර්ෂය තුළ සමස්ථ රැකියාවලින් 66%ක් විය.
- ❖ 2017 වර්ෂය තුළ අපේක්ෂිත පිටත්වීම් සංඛ්‍යාව 201,911කි.
- ❖ විදේශ රැකියා සඳහා කාන්තා සහභාගීත්වය 2017 වර්ෂය තුළ මුළු පිටත්වීම්වලින් 34%කි.
- ❖ කටාර්, සවුදි අරාබිය, කුවේට්, සහ යූ.ඒ.ඊ. ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළෙන් 79%කට වැඩි ප්‍රමාණයක් අත්පත් කරගත් ප්‍රධාන රටවල් විය.
- ❖ 2017 වර්ෂයේ දි පිරිමින්ගෙන් බහුතරයක් නිපුණතා මට්ටමින් බඳවාගෙන ඇත. එය සමස්ථ පිරිමි සංක්‍රමණික සේවකයන්ගෙන් 47%කි.

මූලාශ්‍රය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - Annual Statistics Report - 2017

**නිගමන හා යෝජනා**

- බුද්ධිගලනය ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට යම්කිසි බලපෑමක් සිදු කරන බව ඉහත දත්තවලින් දක්නට ලැබේ.
- පුහුණු ශ්‍රමිකයින් විශාල ලෙස විදේශගත වීම නිසා ආර්ථික වශයෙන් ද බලපෑමක් වන බව පැහැදිළි වේ.
- ශ්‍රී ලංකාවේ රැකියා උත්පාදනය ඉහළ නැංවීම හා සුදුසුකම්වලට ගැළපෙන රැකියා ලබාදීම, සාධාරණ වැටුපක් ලබා දීම වැනි ප්‍රතිපත්තිමය ක්‍රියාදාමයන් වෙනස් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය යම් දුරකට අඩු කළ හැකිය. නමුත් එය එකවර සිදු කළ නොහැකි දිගුකාලීන ක්‍රියාදාමයකි.